සියලුම හිමිකම් ඇවිරිණි

23.07.2019

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2020 අගෝස්තු
General Certificate of Education (Adv.Level) Examination, August 2020

| | | |
|---|---|---|
| ව්‍යාපාර අධ්‍යයනය I<br>Business Studies I | 32 S I | පැය දෙකයි<br>Two hours |

Grade - 12

නම : ................................ පංතිය : ................ විභාග අංකය : ............

සැලකිය යුතුයි.

* ප්‍රශ්න පත්‍රයේ මුළු ප්‍රශ්න සංඛ්‍යාව 50 කි.
* ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න. සෑම ප්‍රශ්නයකටම ලකුණු 02 බැගින් ලැබේ.

Learning Resource Center R De Mazenod College Kandana

## I කොටස

- ප්‍රශ්න අංක 01 සිට 30 දක්වා ප්‍රශ්න වලට පිළිතුරු සැපයීමේදී වඩාත් නිවැරදි පිළිතුර ලකුණු කරන්න.

1. ලෝකයේ විවිධ ව්‍යාපාර දැකිය හැකිය. එම ඕනෑම ව්‍යාපාරයකටම පදනම වන්නේ,

(1) නිෂ්පාදිතයන් ය. (2) ඉල්ලුම හා සැපයුම ය.
(3) වෙළෙඳ පොළ ය. (4) පාරිභෝගික ක්‍රය ශක්තිය ය.
(5) අවශ්‍යතා හා වුවමනාවන් ය. (.......)

2. සමන් ලබාගත් බැංකු ණයක් යොදා ගෙන වෙස් මුහුණු සැකසීමේ කර්මාන්තයක් ආරම්භ කළ අතර ඒවායින් වැඩි ප්‍රමාණයක් යුරෝපා රටවලට යවන ලදී. දේශීයව ද වෙස් මුහුණු අලෙවි කළ සමන් තම හිතවතෙකු පවත්වාගෙන ගිය ලොරි රථ සේවාවකින් රට පුරා බෙදා හරින්නට විය. මෙම සමස්ථ ක්‍රියාවලිය හැඳින්විය හැක්කේ,

(1) කර්මාන්ත ලෙස ය. (2) වාණිජ්‍යය ලෙස ය.
(3) වෙළෙඳාම ලෙස ය. (4) ව්‍යාපාර ලෙස ය.
(5) තෘතියික නිෂ්පාදනය ලෙස ය. (.......)

3. පහත වගුවේ "X" තීරුවේ හි "A" හා "B" වශයෙන් අවශ්‍යතා හා වුවමනා නම් කර ඇත. "Y" තීරුවේ ඒවාට ආවේණික ලක්ෂණ දක්වා ඇත.

| X | Y |
|---|---|
| A – අවශ්‍යතා<br>B – වුවමනා | 1. සමාජ බලවේග මගින් වෙනස් කළ හැකි වීම<br>2. ප්‍රාථමික වීම<br>3. අත්‍යාවශ්‍ය නොවීම<br>4. විවිධත්වය<br>5. මානව උත්පත්තියත් සමඟ ජනිත වේ.<br>6. සීමිත වීම |

අවශ්‍යතා හා වුවමනා වලට ආවේණික ලක්ෂණ නිවැරදිව ගළපා ඇති කාණ්ඩය තෝරන්න.

(1) A – 2, 4, 6 B – 1, 3, 5
(2) A – 1, 3, 6 B – 2, 4, 5
(3) A – 2, 5, 6 B – 1, 3, 4
(4) A – 1, 4, 6 B – 2, 3, 5
(5) A – 1, 5, 6 B – 2, 3, 4 (.......)

4. ව්‍යාපාර කෙරෙහි ඇල්ම ඇති පාර්ශ්ව *(Stake holders)* හා ව්‍යාපාර වලින් ඉටුවිය යුතු සමාජ වගකීම් කිහිපයක් පහතින් දැක්වේ.

| පාර්ශ්වයන් | සමාජ වගකීම් |
|---|---|
| A - අයෝජකයෝ | e - පරිසරය සුරැකීම. |
| B - සේවකයෝ | f - සාධාරන ප්‍රතිලාභ ලැබීම. |
| C - පාරිභෝගිකයෝ | g - වෘත්තීය ආරක්ෂාව තහවුරු කිරීම. |
| D - සමාජය | h - ප්‍රමිතීන් අනුව භාණ්ඩ සැපයීම. |

ඉහත A, B, C, D වලින් දැක්වෙන පාර්ශ්ව වෙනුවෙන් ව්‍යාපාර වලින් ඉටුවිය යුතු සමාජ වගකීම් පිළිවෙළින් නිවැරදිව දැක්වෙන පිළිතුර කුමක්ද ?

(1) f, e, h, g (2) f, g, h, e (3) f, h, e, g (4) g, h, e, f (5) h, g, f, e (.......)

5. ධනසේන රෙදිපිළි වෙළෙඳාමේ යෙදෙන තොග වෙළෙන්දෙකි. මිත්‍රපාල රු 90000 ක් වටිනා රෙදිපිළි ධනසේනගෙන් මිලදී ගත් අතර රු 50000 ක් එවෙලේම ගෙවී ය. ඉතිරි මුදල මාස දෙකකින් ගෙවීමට පොරොන්දු විය.

පහත දී ඇති මුදලේ කාර්යයන් අතුරින් ඉහත සිද්ධියට සම්බන්ධ මුදලේ කාර්යයන් පමණක් ඇතුලත් පිළිතුර තෝරන්න.

A - හුවමාරු මාධ්‍යයකි.
B - වටිනාකමේ මිම්මකි.
C - වටිනාකමේ සන්නිධියකි.
D - විලම්බිත ගෙවුම් මාධ්‍යයකි.

(1) A හා B (2) A , B හා C (3) A , B හා D (4) A හා D (5) B , C හා D (.......)

6. සීමාසහිත පොදු සමාගමක පමණක් දැකිය හැකි ලක්ෂණ වන්නේ,

(1) අඛණ්ඩ පැවැත්මක් තිබීම හා සීමාරහිත වගකීම ය.
(2) කොටස් නිදහසේ පැවරිය හැකිවීම හා උපරිම සාමාජික සංඛ්‍යාව සීමා නොවීම ය.
(3) කොටස් නිදහසේ පැවරිය නොහැකිවීම හා වගකීම සීමිත වීම ය.
(4) උපරිම සාමාජික සංඛ්‍යාව සීමාවීම හා අඛණ්ඩ පැවැත්මක් තිබීම ය.
(5) වගකීම සීමිත වීම හා කොටස්, ණයකර මිල දී ගැනීමට මහජනයාට ප්‍රසිද්ධියේ ආරාධනා කළ නොහැකි වීම ය. (.......)

Grade-12

28-07-2019

7. දළ දේශීය නිෂ්පාදිතයේ ආංශික සංයුතියෙහි කාර්මික අංශයට අයත් දෑ පමණක් ඇතුළත් කාණ්ඩය වන්නේ,

(1) පශු සම්පත් / පතල් / නිෂ්පාදන කර්මාන්ත / ගෑස් / ජල සැපයුම
(2) පතල් / නිවාස අයිතිය / නිෂ්පාදන කර්මාන්ත / ඉදිකිරීම් / දැව
(3) ඉදිකිරීම් / නැමැවුම් / ධීවර / රබර් නිෂ්පාදන / සන්නිවේදනය
(4) කැනීම් / විදුලිය / ගෘහ කර්මාන්ත / ජල සැපයුම / ඉදිකිරීම්
(5) මිනිරන් / කැනීම් / ඇඟළුම් සැකසුම් / ධීවර / නිවාස අයිතිය / ඉදිකිරීම් (........)

8. පාරිභෝගික භාණ්ඩ හා කාර්මික භාණ්ඩවල ලක්ෂණ කිහිපයක් පහතින් දැක්වේ.

A - ගැනුම්කරුවන් සාපේක්ෂව සීමිත වීම.
B - කෙටි ජීවිත කාලයක් පැවතීම.
C - ව්‍යුත්පන්න ඉල්ලුමක් පැවතීම.
D - ඉල්ලුම් කරන වාර ගණන සාපේක්ෂව වැඩි වීම.
E - වෙනත් භාණ්ඩ නිපදවීමට යොදා ගැනීම.

මේවායින් කාර්මික භාණ්ඩවල ලක්ෂණ ඇතුළත් පිළිතුරු කාණ්ඩය වන්නේ,

(1) A B C ය. (2) A C D ය. (3) A D E ය. (4) B C D ය. (5) A C E ය. (........)

Learning Resource Centre
R
De Mazenod College
Kandana

9. රජය මුදල් සැපයුම පාලනය කිරීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව ප්‍රමාණාත්මක උපකරණ හා ගුණාත්මක උපකරණ ණය පාලන උපකරණ යොදාගනී. එම උපකරණ වලින් කිහිපයක් පහතින් දැක්වේ.

A - බැංකු පොළී අනුපාත
B - ප්‍රතිමූල්‍ය පහසුකම් සැපයීම.
C - වරණ පොළී අනුපාත කිරීම
D - ඇපසුරක්ෂිත නියම කිරීම.
E - විවෘත වෙළෙඳ පොළ කටයුතු
F - සංචිත අනුපාතය

ඉහත උපකරණ වලින් ප්‍රමාණාත්මක උපකරණ පමණක් තෝරන්න.

(1) A B C ය. (2) A C F ය. (3) A E F ය. (4) B C D ය. (5) A C E ය. (........)

10. සාර්ථක ව්‍යාපරිකයකු වීමට ව්‍යාපාර පරිසරය හොඳින් අධ්‍යයනය කල යුතු වේ. ව්‍යාපාර පරිසරය අභ්‍යන්තර හා බාහිර වශයෙන් බෙදා දැක්විය හැකිය. බාහිර පරිසරයේ කොටස් කිහිපයක් A වගුවේ හා ඒ සඳහා අන්තර්ගත පරිසර සාධක B වගුවේ දැක්වේ.

| A (බලවේග) | B (සාධක) |
|---|---|
| 1. ආර්ථික හා ප්‍රජා | A නව ශිල්ප ක්‍රම හඳුන්වා දීම |
| 2. දේශපාලන හා නෛතික | B නීති රීති පැනවීම |
| 3. ස්වභාවික හා භූගෝලීය | C ඇදහිලි හා විශ්වාස |
| 4. විද්‍යාත්මක හා තාක්ෂණික | D දේශගුණික තත්ත්ව |
| 5. සමාජ හා සංස්කෘතික | E ජනවාර්ගික සංයුතිය |

A වගුවේ පරිසර බලවේග වලට අදාල B වගුවේ සාධක නිවැරදි ගැලපූ විට අදාල පිළිතුර වන්නේ

(1) B, D, C, A, E (2) B, E, D, A, C (3) E, B, D, A, C
(4) E, B, D, C, A (5) E, B, C, A, D (......)

**11.** චූවමනා පමණක් ඇතුළත් පිළිතුර තෝරන්න.

(1) කුසගින්න, බත්, නිවාස, ඇඳුම් පැළඳුම්, ආරක්ෂාව
(2) ආරක්ෂාව, නිවාස, ආදරය ලබා ගැනීම, විලිවසා ගැනීම
(3) පොත්, තට්ටු නිවාස, රක්ෂණ ඔප්පු, කමිස, හිතවතුන්
(4) ආදරය ලබා ගැනීම, ආරක්ෂාව, නිවාස, කෝපි, ගල්ගුහා
(5) ක්‍රීඩා කිරීම, ආරක්ෂාව ලබා ගැනීම, ඇඳුම් පැළඳුම්, කුසගින්න (......)

**12.** රජයක් විසින් ආර්ථික කටයුතු මෙහෙයවීමෙන් සපුරා ගැනීමට අපේක්ෂා කරන අරමුණක් නොවන්නේ,

(1) රටේ නීතිය හා සාමය ආරක්ෂා කිරීම.
(2) පූර්ණ සේවා නියුක්තිකයන් බිහිකර ගැනීම.
(3) ආර්ථික වර්ධනය වේගවත් කිරීම .
(4) ගෙවුම් ශේෂ සමබරතාවය ඇති කිරීම.
(5) මිල ස්ථායීතාව ඇති කිරීම. (......)

**13.** පහත "අ" කොටසේ සදහන් කාර්යයන් හා සම්බන්ධ ආයතනය "ආ" කොටසින් තෝරා අනුපිළිවෙලින් ගැලපූ විට නිවැරදි පිළිතුර වන්නේ,

| අ | ආ |
|---|---|
| A – සමුපකාර සමිති ලියාපදිංචි කිරීම. | 1. ශ්‍රී ලංකා ජාතික සමුපකාර මණ්ඩලය |
| B – සමුපකාර සේවක විනයානුකූල කටයුතු | 2. සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව |
| C – සමුපකාර ප්‍රතිපත්ති ආරක්ෂා කිරීම. | 3. සමුපකාර සේවක කොමිෂන් සභාව |
| D – අධ්‍යාපනය හා පුහුණුව තුළින් මානව ප්‍රාග්ධන සංවර්ධනය | 4. ජාතික සමුපකාර සංවර්ධන ආයතනය |


(1) A – 2 , B – 1 , C – 3 , D - 4 (2) B – 4 , A – 2 , C – 3 , D - 1
(3) A – 2 , B – 3 , C – 1 , D – 4 (4) B – 2 , D – 4 , C – 3 , A - 1
(5) D – 4 , C – 1 , B – 2 , A – 3 (......)

**14.** හෙන්රි මින්ස්බර්ග් දක්වන පරිදි කළමනාකරුගේ කාර්යයන් හා ඊට අදාල ක්‍රියාකාරකම් පහත සදහන් වගුවේ තීරු දෙකෙහි දැක්වේ. එක් එක් කාර්යය සදහා ගැලපෙන ක්‍රියාකාරකම් අන්තර්ගත සංයෝජන තෝරන්න.

| කාර්යය | ක්‍රියාකාරකම් |
|---|---|
| A – ව්‍යවසායක කාර්යයන් | 1 රැස්වීම් පැවැත්වීම. |
| B – නායකයා ලෙස කටයුතු කිරීම. | 2 ආයතනයේ උපාය මාර්ග සංවිධානය කිරීම හා විමර්ශනයට අදාල ක්‍රියාකාරකම් |
| C – තොරතුරු බෙදා හැරීම. | 3 වෘත්තීය සංගම් හා වෙනත් පාර්ශව සමග යම් යම් එකඟතාවයන් ඇති කර ගැනීම |
| D – කේවල් කිරීම හා ගිවිසුම් වලට එළඹීම. | 4 සහකරුවන් අභිප්‍රේරණය කිරීම. |

(1) C – 1, D – 3, B – 2, A – 4 (2) A – 2, B – 3, C – 1, D – 4
(3) B – 3, A – 1, C – 4, D – 2 (4) A – 2, C – 4, D – 1, B – 3
(5) C – 1, A – 2, B – 4, D – 3 (.......)

**15.** පහත රූප සටහනේ කළමනාකරණ මට්ටම් හා කළමනාකරණ කුසලතාවයන් නිරූපනය කරයි. එම රූප සටහනේ A,B,C අක්ෂර වලින් ප්‍රකශවන කළමනාකරණ කුසලතා පිළිවෙලින් සඳහන් කරන්න.




(1) තාක්ෂණික කුසලතා, අන්තර් පුද්ගල සම්බන්ධතා, මනෝභාවාත්මක කුසලතා
(2) මනෝභාවාත්මක කුසලතා, අන්තර් පුද්ගල සම්බන්ධතා, තාක්ෂණික කුසලතා
(3) අන්තර් පුද්ගල සම්බන්ධතා, මනෝභාවාත්මක කුසලතා, තාක්ෂණික කුසලතා
(4) තාක්ෂණික කුසලතා, මනෝභාවාත්මක කුසලතා, අන්තර් පුද්ගල සම්බන්ධතා
(5) මනෝභාවාත්මක කුසලතා, තාක්ෂණික කුසලතා, අන්තර් පුද්ගල සම්බන්ධතා (.......)

**16.** මෝටර් රථවාහන රක්ෂණය යටතේ ලබාගත හැකි රක්ෂණ ඔප්පු වර්ග වන්නේ,

A අනුෂාංගික අලාභ රක්ෂණය
B අවම තෙවන පාර්ශ්ව රක්ෂණය
C අලුත්වැඩියා ඔප්පුව
D සම්පූර්ණ වගකීම් සහිත රක්ෂණය
E තෙවන පාර්ශ්ව ගිනි හා සොරකම් රක්ෂණය
F සමූහ මෝටර් රථ රක්ෂණය

(1) ABCD (2) ACDE (3) BCDE (4) BDEF (5) CDEF (.......)

**17.** හවුල් ව්‍යාපාර සම්බන්ධව බලපාන නීති මූලාශ්‍ර හා ඊට අදාල වන කරුණු පහත පරිදි ලැයිස්තුගත කර ඇත.

| නීති මූලාශ්‍රය | අදාල කරුණු |
|---|---|
| 1. 1890 හවුල් ව්‍යාපාර ආඥා පනත | A සීමිත හවුල් ව්‍යාපාර සම්බන්ධයෙන් බලපායි. |
| 2. 1840 අංක 07 දරන වංචා වැලැක්වීමේ ආඥා පනත | B බුන්වත් වූ හවුල්කරුවකුගේ වගකීම් බෙදා ගැනීම. |
| 3. ගානර්ට එරෙහිව මරේ නඩු තීන්දුව | C ව්‍යාපාරය ව්‍යාජ නමකින් පවත්වාගෙන යන්නේ නම් ලියාපදිංචිය අනිවාර්යය වේ. |
| 4. 1918 අංක 06 දරන ව්‍යාපාර නාම ආඥා පණත / අදාල පලාත් සභාවේ ව්‍යාපාර නාම ආඥා පනත | D ආයෝජිත ප්‍රාග්ධනය රු 1000 ට වඩා වැඩි නම් ලිඛිත ගිවිසුමක් තිබීම අනිවාර්යය වේ. |
| 5. 1907 සීමිත හවුල් ව්‍යාපාර පනත | E හවුල් ව්‍යාපාරයක සිටිය යුතු සමාජික සංඛ්‍යාව |
| 6. 2007 අංක 07 දරන සමාගම් පනත | F හවුලක ස්වභාවය පැවැත්ම විසුරුවා හැරීම ගිවිසුමක් නොමැති විට කටයුතු කිරීම. |

Learning Resource Centre
R
De Mazenod College
Kandana

නීති මූලාශ්‍රයට අදාල කරුණු අනුපිළිවෙල වන්නේ

(1) EBCDAF (2) ECBDAF (3) FDBCAE (4) FDDEAC (5) BDEFAC (......)

**18.** කුඩා පරිමාණ ව්‍යාපාර සඳහා විවිධ පහසුකම් සපයන රාජ්‍ය ආයතන රාශියක් ඇත. එම පහසුකම් හා රාජ්‍ය ආයතන අතර සම්බන්ධතාවය වන්නේ

| සපයන විවිධ පහසුකම් | විවිධ පහසුකම් සපයන ආයතන |
|---|---|
| 1. උපදේශන සේවා | A හස්ත කර්මාන්ත මණ්ඩලය (ලක්සල) |
| 2. පර්යේෂණ හා තාක්ෂණික පහසුකම් | B ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය |
| 3. යටිතල පහසුකම් | C ජාතික ව්‍යාපාර කළමනාකාරිත්ව ආයතනය |
| 4. අලෙවි පහසුකම් | D ලංකා පුත්‍ර සංවර්ධන බැංකුව |
| 5. මූල්‍ය පහසුකම් | E කාර්මික සංවර්ධන මණ්ඩලය |

(1) DCBAE (2) DAECB (3) EBACD (4) ABEDE (5) CBEAD (......)

**19.** නායකයකු ලෙස පිළිගැනීමට නම් අනිවාර්යය කොන්දේසි හතරක් සැපිරිය යුතුය. ඒවානම්

A නිශ්චිත පරමාර්ථයක් ඉටු කර ගැනීමට අනුගාමිකයන්ට බලපෑම් කිරීම.

B අනුගාමිකයන් පිරිසක් සිටීම.

C මූල්‍ය ශක්තිය හා දරා ගැනීමේ හැකියාව

D අනුගාමිකයන් නායකයා කෙරෙහි බලපෑම් ඇති කිරීමට හැකි ශක්තියට වඩා ශක්තියක් නායකයාට අනුගාමිකයා වෙත බලපෑම් කිරීමට හැකිවීම.

E අනුගාමිකයන් තම නායකයා ලෙස ඔහු පිළිගැනීම.

F පිරිස් බලය ඉතා ඉහල අගයක් ගැනීම.

(1) ABCD (2) ABEF (3) ABDE (4) ABEF (5) ACEF (......)

**20.** ශ්‍රී ලංකාවේ බදු අයකරන ආයතන හා අයකරන බදු වර්ග ලැයිස්තුවක් පහතින් දැක්වේ.

| බදු අයකරන ආයතනය | බදු වර්ග |
|---|---|
| 1. දේශීය ආදායම් බදු දෙපාර්තමේන්තුව | A මුල් ලියාපදිංචි බදු, පැවරුම් බදු |
| 2. ශ්‍රී ලංකා රේගුව | B පිරිවැටුම් බදු පනත, වරිපනම් බදු |
| 3. සුරාබදු දෙපාර්තමේන්තුව | C ආදායම් බදු එකතු කළ අගය මත බදු |
| 4. පළාත් සභාව | D සිගරට් දුම්කොළ මත නිෂ්පාදන බදු, මත්පැන් බද්ද |
| 5. මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් දෙපාර්තමේන්තුව | E ආනයන තීරු බදු , අපනායන තීරු බදු |

අදාල ආයතනයට අනුව බදු වර්ගය ගැලපූ විට ලැබෙන පිළිතුර වන්නේ

(1) ABCDE (2) BADCE (3) ECDAB (4) DEABC (5) CEDBA (......)

**21.** හෙන්රි මින්ස්බර්ග්ට අනුව කළමනාකරුවන්ගේ අන්තර් පුද්ගල භූමිකාවකි

(1) නියාමකයකු ලෙස කටයුතු කිරීම (2) ප්‍රකාශකයකු ලෙස කටයුතු කිරීම

(3) නායකයකු ලෙස කටයුතු කිරීම (4) ව්‍යවසායකයකු ලෙස කටයුතු කිරීම

(5) කේවල් කරන්නකු ලෙස කටයුතු කිරීම (......)

2. කළමනාකරණ කාර්යයක් වශයෙන් සංවිධානකරණයේ අරමුණක් වන්නේ,

(1) ප්‍රතිඵල සැලසුම්වලට අනුකූලවේ දැයි සහතික කර ගැනීම ය.
(2) කාර්යයන් ඉටුකිරීම සඳහා සේවකයන් තුළ උද්‍යෝගය ඇති කිරීම යි.
(3) උපක්‍රමික සැලසුම් සඳහා මෙහෙයුම් සැලැස්ම ගැලපීමයි.
(4) කාර්යයන් ඉටුකර ගැනීම සඳහා මානව හා සෙසු සම්පත් බෙදාහැරීම යි.
(5) පරමාර්ථ ඉටුකර ගැනීම සඳහා සේවක චර්යාව කෙරෙහි බලපෑම් ඇති කිරීම යි. (......)

3. සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත කෙරෙහි ශ්‍රී ලංකාව වැඩි අවධානයක් යොමු කරනුයේ,

(1) තරගකාරිත්වය වැඩි කිරීම සඳහා ය.
(2) ආනයන ආදේශන කර්මාන්ත ඇති කිරීම සඳහා ය.
(3) දේශීය අමුද්‍රව්‍ය වලින් ප්‍රයෝජන ලබාගැනීම සඳහා ය.
(4) ආර්ථික සංවර්ධනය වේගවත් කිරීම සඳහා ය.
(5) විදේශ විනිමය අවම වශයෙන් භාවිතා කරන ව්‍යාපාර කටයුතු දිරිමත් කිරීම සඳහා ය. (......)

Learning Resource Center
R
De Mazenod College
Kandana

4. ව්‍යාපාර සංවිධාන කිහිපයක් හා ඒවාට අදාළ කරුණු කිහිපයක් පහත වගුවේ දැක්වේ.

| ව්‍යාපාර සංවිධාන | අදාළ කරුණු |
|---|---|
| . රාජ්‍ය සංස්ථා . | 1. සෑම සාමාජිකයකුටම කොටස් ප්‍රමාණය අනුව ඡන්ද බලය හිමිවේ. |
| . හවුල් ව්‍යාපාර | 2. රජයේ සෘජු පාලනයට යටත් වේ. |
| . සමුපකාර සමිති | 3. පොදු හෝ විශේෂ පාර්ලිමේන්තු පනතක් යටතේ සංස්ථාපිත කෙරේ |
| . සීමාසහිත පොදු සමාගම් | 4. එක් සාමාජිකයකුට හිමි වන්නේ එක් ඡන්දයක් පමණි. |
| . රාජ්‍ය දෙපාර්තමේන්තු | 5. 1918 ව්‍යාපාර නාම ආඥා පනත බලපායි. |

ව්‍යාපාර සංවිධාන හා අදාළ කරුණු නිවැරදිව ගළපා ඇති කාණ්ඩය තෝරන්න.

(1) A2, B5, C1, D3, E4  (2) A3, B4, C1, D5, E2
(3) A2, B4, C5, D1, E3  (4) A3, B5, C4, D1, E2
(5) A3, B5, C1, D4, E2 (......)

5. ව්‍යවසායකත්ව සංවර්ධනයට බලපාන සාධක හා ඊට එරෙහිවන සාධක කිහිපයක් පහතින් දැක්වේ.

A - මනෝ විහිතිය
B - පරිකල්පන චින්තනය
C - ආදර්ශ චරිත
D - අනුකරණය
E - අත්දැකීම්
F - ගතානුගතික බව

ඉහත දැ අතුරින් ව්‍යවසායකත්ව සංවර්ධනයට එරෙහිවන සාධක කිහිපයක් වන්නේ,

(1) A, D, F  (2) B, C, E  (3) B, C, D  (4) C, D, E  (5) D, E, F (......)

26. උද්ධමනයේ බලපෑම පිළිබඳව සාවද්‍ය ප්‍රකාශය තෝරන්න.

(1) ස්ථාවර ආදායම් ලබන්නන්ට උද්ධමනය අහිතකර ලෙස බලපායි.
(2) ඉතිරි කිරීම් වල යොමුවන්නන්ට සාමාන්‍යයෙන් උද්ධමනය අහිතකර ලෙස බලපායි.
(3) ණය සැපයුම්කරුවන්ට උද්ධමනය අවාසි දායක වේ.
(4) ණය ලබාගන්නා පුද්ගලයන්ට මෙන්ම ආයතනවලට ද උද්ධමනය අවාසි දායක වේ.
(5) රජයේ සේවකයන්ට උද්ධමනය අහිතකර ලෙස බලපායි. (......)

27. කළමනාකරුවන් වර්ග කිරීමට යොදාගත හැකි පදනම් තුනකි.

(1) බලතල හෙවත් අධිකාරිය / විශේෂඥතාවය / කටයුතුවල ස්වභාවය
(2) සංවිධානයේ ස්වභාවය / කටයුතුවල ස්වභාවය / විශේෂඥතාවය
(3) බලතල හෙවත් අධිකාරිය / කළමනාකරුවන්ගේ වයස / පලපුරුද්ද
(4) විශේෂඥතාවය / බලතල හෙවත් අධිකාරිය / සංවිධානයේ ස්වභාවය
(5) බලතල හෙවත් අධිකාරිය /අධ්‍යාපන හා වෘත්තිය නිපුනතාවය / කටයුතුවල ස්වභාවය (......)

28. සුනිල් තම අනුගාමිකයන්ගේ අදහස් සැලකිල්ලට භාජනය නොකරයි. තමන් කැමති තීන්දු නිතරම ගනී. නිමල් තම අනුගාමිකයන්ට කටයුතු කිරීම සඳහා මෙන්ම තීරණ ගැනීමට ද නිදහස ලබා දී ඇත. කමල් අනුගාමිකයන් සමඟ සාකච්ඡා කොට නිතරම කටයුතු කරයි. සුනිල්, නිමල්, කමල් යන අය ඇතුළත් ක හැකි නායකත්ව ශෛලීන් පිළිවෙලින් දැක්වූ විට,

(1) ප්‍රජාතන්ත්‍රවාදි / ඒකාධිපති / නිර්බාධවාදි
(2) ඒකාධිපති / ප්‍රජාතන්ත්‍රවාදි / නිර්බාධවාදි
(3) නිර්බාධවාදි / ප්‍රජාතන්ත්‍රවාදි / ඒකාධිපති
(4) නිර්බාධවාදි / ඒකාධිපති / ප්‍රජාතන්ත්‍රවාදි
(5) ඒකාධිපති / නිර්බාධවාදි / ප්‍රජාතන්ත්‍රවාදි (......)

29. පහත වගුවේ දැක්වෙන්නේ ව්‍යාපාර වර්ග කිරීමේ පදනම් කිහිපයක් සහ ව්‍යාපාර වර්ග කිහිපයකි.

| ව්‍යාපාර වර්ග කිරීමේ පදනම් | ව්‍යාපාර වර්ග |
|---|---|
| 1. නිෂ්පාදනයේ ස්වභාවය අනුව | A. කෘෂි / කාර්මික / සේවා |
| 2. නිෂ්පාදන අංශ අනුව | B. සුළු / මධ්‍ය / මහා |
| 3. හිමිකාරිත්වය අනුව | C. ප්‍රාථමික / ද්විතියික / තෘතියික |
| 4. අරමුණ අනුව | D. ලාභ ලැබීම / ලාභය සඳහා නොවන |
| 5. පරිමාණය අනුව | E. පෞද්ගලික / පොදු |

ව්‍යාපාර වර්ග පදනම්වලට අනුකූල ව ගැලපූ විට ලැබෙන නිවැරදි පිළිතුර තෝරන්න.

(1) 1A, 2B, 3C, 4D, 5E
(2) 1A, 2C, 3E, 4D, 5B
(3) 1C, 2A, 3D, 4E, 5B
(4) 1C, 2A, 3E, 4D, 5B
(5) 1B, 2A, 3E, 4C, 5D (......)

30. සමාගමක සාමාන්‍ය කොටස් හිමියකුට සාපේක්ෂව වරණීය කොටස් හිමියකුට ලැබෙන ප්‍රතිලාභයකි.

(1) ලාභ අධික වර්ෂයක දී වැඩි ලාභාංශ ලැබීම.
(2) සමාගමේ සංචිතවලට හිමිකම් ලැබීම.
(3) නිශ්චිත ලාභාංශ ලැබීම.
(4) අධ්‍යක්ෂ මණ්ඩලයට පත්වීමේ අවකාශයක් පැවතීම.
(5) ඡන්ද බලය හිමි වීම. (......)

**අංක 31 සිට 50 දක්වා ප්‍රශ්න වලට නිවැරදි පිළිතුරු සපයන්න.**

ට විකුණන ලද භාණ්ඩ වල මුදල් එකතු කිරීමේ වගකීම් භාරගන්නා නියෝජිතයා ................................ ලෙස හඳුන්වන අතර භාණ්ඩ තමා වෙත රඳවා ගෙන පාදකයා වෙනුවෙන් විකිණීම කර කොමිස් මුදලක් ලබා ගන්නා නියෝජිතයා ................................ ලෙස හඳුන්වයි.

සිවිඩයේ අවශ්‍ය සියලු තොරතුරු නොඅඩුව පැවතිය යුතු බව ................................ ුස ද ලබන්නා පිළිබඳ මනා අවබෝධයකින් යුතුව ඔහුන්ගේ අවධානය පණිවිඩයට යොමුවන පුරින් ඉදිරිපත් කළ යුතු බව ................................ ලෙස ද හඳුන්වයි.

ුහුදු රක්ෂණයේදී නිකුත් කරන ඔප්පු වර්ග ................................ හා ................................ වශයෙන් ප්‍රභේද දෙකකි.

යම් විෂය වස්තුවක් එහි රක්ෂකයා විසින් වෙනත් රක්ෂණ ආයතනයක නැවත රක්ෂණය කිරීම ................................ ලෙසත් එකම විෂය වස්තුව රක්ෂණ ආයතන දෙකක හෝ කිහිපයක රක්ෂණය කිරීම ................................ ලෙසත් හඳුන්වයි.

රක්ෂණ කර්මාන්තය සංවර්ධනය හා නියාමනය සම්බන්ධයෙන් වගකීම පැවරී ඇත්තේ ................................ට ය.

. යම් විෂය වස්තුවකට මූල්‍යමය අලාභ ඇතිවීට ඇති සම්භාවිතාව ................................ ලෙසත් අලාභය ඇති වීමට හේතුව ................................ ලෙස ත් හැඳින්විය හැක.

7. ණය ලබා ගන්නා පුද්ගලයන්ගේ ණය පිළිබඳ තොරතුරු එක්රැස් කිරීම හා තම සාමාජික ආයතන වලට ණය තොරතුරු සැපයීම මූලික අරමුණ කරගෙන ................................ පිහිටුවා ඇත.

38. සුලභතාවය අතින් වාසිදායක ප්‍රවාහන මාර්ගය වන්නේ ................................ ය. නමුත් පිවිසීමේ හැකියාව අතින් වාසිදායක වන්නේ ................................ මාර්ගය යි.

39. ලබන්නා විසින් ඇසුන හෝ කියවූ දෙයක් පිළිබඳව දක්වන ප්‍රතික්‍රියාව ................................ ලෙස ත් එලෙස පණිවුඩය ලැබූ බව, එය තේරුම්ගත් බව තහවුරු කරමින් ලබන්නාගෙන් ලැබෙන ප්‍රතිචාරය ................................ ලෙසත් හැඳින්විය හැක.

40. ව්‍යවසායකත්ව සංවර්ධනයට බලපාන සමාජ විද්‍යාත්මක සාධක ලෙස ................................ , ................................ , ................................ හා ................................ දැක්විය හැක.

Learning Resource Center
R
De Mazenod College
Kandana

41. ව්‍යවසායකයා ප්‍රථමයෙන් භාණ්ඩයක් හෝ සේවාවක් නිර්මාණය කිරීමේ අදහසක් ඇති කරගෙන ඒ සඳහා වෙළෙඳ පොළ අවස්ථා සොයා බැලීම .............................................................................. ලෙස හඳුන්වයි.

42. කුඩා ව්‍යාපාර හඳුනාගැනීම සඳහා භාවිතා කරන ප්‍රමාණාත්මක නිර්ණායකයක් ලෙස .............................................................. හැඳින්විය හැකි අතර .............................................................. ගුණාත්මක නිර්ණායකයකි.

43. හෙන්රි මින්ස්බර්ග්ට අනුව කළමනාකරුවන්ගේ භූමිකා .............................................................., .............................................................. හා .............................................................. භූමිකා වශයෙන් ප්‍රධාන ශීර්ෂ තුනකි.

44. කාර්යක්ෂම හා සඵලදායි කළමනාකරුවකු තුළ තිබිය යුතු මූලික අංග තෙවර්ගය වන්නේ දැනුම, .............................................................. හා .............................................................. යන්න.

45. ආයතනයක ඉලක්ක හා පරමාර්ථ ස්ථාපිත කිරීම හා ඒවා සාක්ෂාත් කර ගැනීමට අවශ්‍ය කටයුතු පිළියෙල කිරීමේ ක්‍රියාවලිය .............................................................. යි.

46. තීරණ ගැනීම පිළිබඳ සියලු බලතල ඉහළ කළමනාකරුවන් සතු නම් එය .............................................................. ලෙස ත් තීරණ ගැනීමේ බලතල ඉහළ සිට පහළ කළමනාකරණ මට්ටම් වලට ගලා යන්නේ නම් එය .............................................................. ලෙසත් හැඳින්විය හැක.

47. ආයතනයක කටයුතු බෙදී ඇති ආකාරය සංවිධානය වී ඇති ආකාරය හා සමායෝජනය වී ඇති ආකාරය .............................................................. තුළින් පෙන්නුම් කරයි.

48. යම් කළමනාකරුවකුට සෘජුවම වාර්තා කරන සහකරුවන් සංඛ්‍යාව .............................................................. ලෙස හඳුන්වයි. මෙය ප්‍රධාන ආකාර දෙකකි එනම් .............................................................. හා .............................................................. දක්නට ඇත.

49. නියම කරන ලද කාර්යයන් සම්පූර්ණ කිරීම සඳහා සහකරුවන්ට විධිමත් අධිකාරිය සහ වගකීම් පවරාදීමේ ක්‍රියාව .............................................................. ලෙස හැඳින්වේ.

50. සත්‍ය වශයෙන් සිදුවන කටයුතු සැලසුම්ගත කටයුතුවලට අනුව සිදුවන්නේදැයි තහවුරු කර ගැනීමේ ක්‍රියාවලිය .............................................................. යි.

❋❋❋❋❋

සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

23.07.2019

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2020 අගෝස්තු
General Certificate of Education (Adv.Level) Examination, August 2020

| | | |
|---|---|---|
| ව්‍යාපාර අධ්‍යයනය II<br>Business Studies II | 32 S II | පැය තුනයි<br>Three hours |

12 ශ්‍රේණිය

උපදෙස් :

* එක් කොටසකින් අවම වශයෙන් ප්‍රශ්න දෙක බැගින්වත් තෝරාගෙන ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.

## I කොටස

1.

(i) ව්‍යාපාරවලට විවිධ අරමුණු තිබිය හැක. ඉන් ප්‍රධාන අරමුණු අරමුණු **හතරක්** නම් කර පැහැදිලි කරන්න. (ලකුණු 04)

(ii) "ස්වයංපෝෂිත අර්ථ ක්‍රමය තුළ සෘජු නිෂ්පාදන ක්‍රමයක් ක්‍රියාත්මක වූ අතර සෘජු නිෂ්පාදනය තුළින් පුද්ගල විශේෂීකරණය ඇති විය."

(අ) ඉහත විස්තරයේහි සඳහන් "සෘජු නිෂ්පාදනය" යනු කුමක් දැයි නිදසුන් සහිතව පැහැදිලි කරන්න. (ලකුණු 02)

(ආ) පුද්ගල විශේෂීකරණයේ හිතකර හා අහිතකර ප්‍රතිඵල **දෙක** බැගින් වෙන් කර දක්වන්න. (ලකුණු 02)

(iii) පහත දැක්වෙන්නේ ව්‍යාපාරය කෙරෙහි උනන්දුවක් දක්වන පාර්ශ්ව කිහිපයකි.

(අ) ගනුදෙනුකරුවන් (ආ) රජය
(ඇ) සේවකයන් (ඈ) ණය සැපයුම්කරුවන්

මෙම එක් එක් පාර්ශ්වය වෙතින් ව්‍යාපාරය අපේක්ෂා කරන දායකත්වයන් **දෙක** බැගින් ලියා දක්වන්න. (ලකුණු 04)

(iv) (අ) ව්‍යාපාරයක ආසන්න පරිසර බලවේග **හතරක්** නම් කරන්න. (ලකුණු 02)

(ආ) ඔබ ඉහත නම් කළ ආසන්න පරිසර බලවේග අතරින් දෙකක් තෝරා ගෙන එමගින් එල්ල විය හැකි තර්ජන වලට මුහුණ දීම සඳහා ගත හැකි ක්‍රියාමාර්ග මොනවාදැයි පැහැදිලි කරන්න. (ලකුණු 02)

(v) පහත දක්වා ඇත්තේ ඔබ ප්‍රදේශයේ පිහිටි ව්‍යාපාර ආයතන **දෙකක්** යැයි සිතන්න.

(අ) රාජපක්ෂ හෝටලය
(ආ) ජානක කුළුබඩු නිෂ්පාදකයෝ

ඔම ව්‍යාපාර ආයතන දෙක අතරින් (ආ) ව්‍යාපාරය ප්‍රදේශයේ බෙහෙවින් ජනප්‍රිය අතර (අ) ව්‍යාපාරය කෙරෙහි මහජන අප්‍රසාදය දිනෙන් දින ඉහළ යයි.

මෙම ප්‍රවණතාවය කෙරෙහි ඉවහල් විය හැකි සාධක ව්‍යාපාර ආචාරධර්ම ඇසුරින් විග්‍රහ කරන්න. (ලකුණු 04)



Learning Resource Center R De Mazenod College Kandana

**2.**

(i) රජයක් විසින් සාක්ෂාත් කර ගැනීමට අපේක්ෂා කරන අරමුණු **හතරක්** පැහැදිලි කරන්න.
(ලකුණු 04)

(ii) (අ) රජය පසුගිය කාලය තුළ අවස්ථා කිහිපයකදීම මෝටර් රථ ආනයනය සම්බන්ධයෙන් බදු ඉහළ නංවන ලදි. මෙලෙස බදු ඉහළ නැංවීම නිසා ඇති විය හැකි බලපෑම් **හතරක්** නම් කරන්න.
(ලකුණු 02)

(ආ) "ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය සිදුකරන්නේ ප්‍රමිති පිළියෙල කිරීම පමණි." සාකච්ඡා කරන්න.
(ලකුණු 02)

(iii) රුමේෂිකා සහ අයේෂා යන මිතුරියන් දෙදෙනා එක්ව රෙදිපිළි හා ඇගළුම් අලෙවිසැලක් ආරම්භ කර පවත්වාගෙන ගිය ද ඔහුන් අතර ලිඛිත හවුල් ගිවිසුමක් නොතිබුණි.

පහත කරුණු සම්බන්ධයෙන් ඔහුන් අතර යම් යම් මතභේද උද්ගත වී ඇති බැවින් ඒ ඒ කරුණු සම්බන්ධයෙන් ඔහුන් ක්‍රියා කළ යුත්තේ කෙසේ දැයි පහදා දෙන්න.

(අ) ව්‍යාපාරයට යෙදූ ප්‍රාග්ධනය සඳහා පොලී ලබා ගැනීම

(ආ) ව්‍යාපාරයට ලබා දුන් ණය සඳහා පොළී ලබා ගැනීම

(ඇ) රුමේෂිකා සහ ආයේෂාට මාසික වැටුප් ලබාදීම

(ඈ) ව්‍යාපාරයට එරංජන් නම් රුමේෂිකාගේ හිතවතෙකු එක්කර ගැනීමට රුමේෂිකාට අවශ්‍ය වී තිබීම
(ලකුණු 04)

(iv) සීමාසහිත පෞද්ගලික සමාගමක් සහ සීමාසහිත පොදු සමාගමකින් වෙන් වන්නේ කෙසේ දැයි පෙන්වා දෙන්න.
(ලකුණු 04)

(v) "වරලත් ව්‍යාපාරයකින් වරලත් ලාභියාට මෙන් ම වරලත් හිමියාට ද යම් යම් අවාසි ඇති වේ." මෙම ප්‍රකාශය කරුණු දක්වමින් සනාථ කරන්න.
(ලකුණු 04)

**3.**

(i) (අ) වෙළෙඳපොළින් ඇදී එන ව්‍යවසායකත්වය හා නිෂ්පාදිත මගින් තල්ලුවන ව්‍යවසායකත්වය අතර වෙනස පෙන්වා දෙන්න.
(ලකුණු 02)

(ආ) සමාජයේ පවත්නා විවිධ ගැටලුවලට විසඳුම් සෙවීමේ ප්‍රතිඵලයක් ලෙස ව්‍යවසායකයන් බිහි වන බව පැහිදිලි වේ. සාකච්ඡා කරන්න.
(ලකුණු 02)

(ii) (අ) "ඇතැම් කුඩා ව්‍යාපාර ආරම්භ කර කෙටි කාලයකින් අසාර්ථක වීමේ ප්‍රවණතාවයක් පවතී." එලෙස කුඩා ව්‍යාපාරවල අසාර්ථකත්වයට ඉවහල් වන සාධක **දෙකක්** පැහැදිලි කරන්න.
(ලකුණු 02)

(ආ) පාරිභෝගිකයකු වශයෙන් වෙළෙඳපොළින් භාණ්ඩ මිලදී ගැනීමේ දි ඔබේ අවධානයට යොමු විය යුතු කරුණු මොනවාදැයි සඳහන් කරන්න.
(ලකුණු 02)

(iii) (අ) ජාතික ප්‍රමිති පද්ධතියක් ක්‍රියාත්මක කිරීම තුළින් රටකට අත්වන ප්‍රතිලාභ දෙකක් පැහැදිලි කරන්න.
(ලකුණු 02)

23.07.2019 12 ශ්‍රේණිය.

(ආ) ඔබ එක්තරා සීමිත පොදු සමාගමක කොටස් හිමියෙක් යැයි සිතන්න. එම සමාගමෙන් කොටස් මිලදී ගැනීම නිසා ඔබට හිමිවන අයිතිවාසිකම් හා ඔබ ඉටු කළ යුතු යුතුකම් **දෙක** බැගින් ලියන්න. (ලකුණු 02)

(iv) (අ) සීමාසහිත පොදු සමාගමකට සංස්ථා ප්‍රකාශය වැදගත් වන්නේ කුමක් නිසා දැයි පහදන්න. (ලකුණු 02)

(ආ) හිමිකාරිත්වය අනුව පෞද්ගලික හා පොදු (රාජ්‍ය) වශයෙන් ව්‍යාපාර සංවිධාන වර්ග කළ හැකිය. රටක පොදු අයිතිය යටතේ ද ව්‍යාපාර පවත්වාගෙන යාමට හේතු මොනවාදැයි සඳහන් කරන්න. (ලකුණු 02)

(v) (අ) රජයේ ආර්ථික අරමුණු **හතරක්** සඳහන් කරන්න. (ලකුණු 02)

(ආ) රජය විසින් ව්‍යාපාර වෙනුවෙන් සපයනු ලබන යටිතල පහසුකම් හා අත්‍යවශ්‍ය සේවාවන් ලැයිස්තුගත කරන්න. (ලකුණු 02)

4.

(i) (අ) ජාත්‍යන්තර වෙළෙඳාම තුළින් රටකට අත්කර ගත හැකි ප්‍රතිලාභ **හතරක්** සඳහන් කරන්න. (ලකුණු 02)

(ආ) ජාත්‍යන්තර වෙළෙඳාමේ ව්‍යාප්තියට එරෙහි බාධා **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 02)

(ii) (අ) සීමාසහිත පොදු සමාගමක පාලන බලය හිමිවන්නේ කාහට ද? ඔහුන් මෙම බලය ක්‍රියාත්මක කරන ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 02)

(ආ) අතරමැදියන් රහිතව භාණ්ඩ බෙදාහැරීම තුළින් නිෂ්පාදයාට හා පාරිභෝගිකයාට අත්වන වාසි හා අවාසි වෙන වෙනම සඳහන් කරන්න. (ලකුණු 02)

(iii) (අ) සාමාන්‍ය ව්‍යාපාරිකයකුට වඩා කෙබඳු වෙනසක් ව්‍යවසායකයකු තුළ ඔබ දකින්නේද? (ලකුණු 02)

(ආ) බොහෝ රටවල රජයන් කුඩා ව්‍යාපාර ඒකක සංවර්ධනය උනන්දු කරවීමට විශේෂ කැමැත්තක් දක්වයි. මෙයට හේතු කවරේදැයි ශ්‍රී ලංකාවේ ආර්ථිකය ආශ්‍රයෙන් පැහැදිලි කරන්න. (ලකුණු 02)

(iv) (අ) ගනුදෙනු සඳහා ව්‍යවහාර මුදල් හා චෙක්පත් භාවිතය අඩු වෙමින් පවතින අතර විද්‍යුත් මුදල් භාවිතය වැඩි වී ඇත. මෙසේ විද්‍යුත් මුදල් භාවිතය වැඩි වීමට හේතු කවරේ ද? (ලකුණු 02)

(ආ) හරපත ***(Debit Card)*** සහ ණයපත ***(Credit Card)*** අතර පවත්නා සමාන හා අසමානතා කවරේද? (ලකුණු 02)

(v) **පහත සඳහන් ඒවා පිළිබඳ කෙටි සටහන් ලියන්න.**

- ප්‍රභවස්ථාන සහතිකය
- බන්ධිත ගුදම
- නෞභාර පත්‍රය
- ආනයන සටහන්කරය

(ලකුණු 04)

Learning Resource Center
R
De Mazenod College
Kandana

## II කොටස

**5.**

(i) (අ) අචිනි හා නෙහාරා සම වයසේ සිටින උපාධිධාරී ගුරුවරියන් දෙදෙනකි. මාසික වැටුපෙන් අඩුකර ගැනීමේ එකඟත්වයෙන් එකම රක්ෂණ සමාගමකින් ජීවිත රක්ෂණ ඔප්පු දෙකක් මිලදීගෙන ඇත. දෙදෙනාගේ වැටුපෙන් අඩුකරන වාරික මුදල්වල වෙනසක් පවතී. මෙයට බලපෑ හැකි ප්‍රධාන හේතු මොනවාද? (ලකුණු 02)

(ආ) සන්නිවේදන ක්‍රියාවලියේ අන්තර්ගත ප්‍රතිචාරය සහ ප්‍රතිපෝෂණය වෙන් වෙන් ව හඳුන්වන්න (ලකුණු 02)

(ii) පහත සඳහන් තොරතුරු ආශ්‍රයෙන් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

- දේශාන් පියාගෙන් උරුම වූ වාහන අලුත්වැඩියා කිරීමේ ව්‍යාපාරය, නවීකරණය කර පවත්වාගෙන යයි.
- කයිල් ඩෙංගු උවදුර වැළැක්වීමට දේශීය ඖෂධ භාවිතා කරමින් මදුරු දඟරයක් හඳුන්වා දෙයි.
- යසිරු පැරණි ගීතවලට සංගීතය මුසු කරමින් නව ගීත තැටියක් හඳුන්වා දෙයි.

– මෙම තිදෙනා අතුරින් සාර්ථක ව්‍යවසායකයකු ලෙස ඔබ සලකන්නේ කවුරුන් ද?
– ඔබ යෝජනා කරන ව්‍යවසායකයා සතු විය යුතු ගති ලක්ෂණ **තුනක්** නම් කරන්න. (ලකුණු 04)

(iii) (අ) ශ්‍රී ලංකාවේ නාගරික ප්‍රදේශ ආශ්‍රිතව උදේ සහ හවස් කාලවලදී දැඩි මහා මාර්ග තදබදයක් දැකිය හැකිය. මෙම තත්ත්වය මඟ හරවා ගැනීම සඳහා ඔබ කරන යෝජනා කවරේද? (ලකුණු 02)

(ආ) ශ්‍රී ලංකාවේ දුම්රිය මාර්ග ප්‍රවාහනය දියුණු කිරීම සඳහා ගත හැකි ක්‍රියාමාර්ග **හතරක්** සඳහන් කරන්න. (ලකුණු 02)

(iv) (අ) ලිඛිත සන්නිවේදන ක්‍රමවලට සාපේක්ෂව වාචික සන්නිවේදනයේ පවතින වාසි හා අවාසි **දෙක** බැගින් ලියන්න. (ලකුණු 02)

(ආ) මේ වන විට සාමාන්‍ය ජන ජීවිතයේ මෙන්ම ව්‍යාපාරික ලෝකයේ ද සන්නිවේදන කටයුතු සඳහා "අන්තර්ජාලය" භාවිතය ශීඝ්‍රයෙන් ඉහළ ගොස් ඇති බව පෙනේ. මෙම ප්‍රවණතාවයට ඉවහල් වී ඇති සාධක දෙකක් විස්තර කරන්න. (ලකුණු 02)

(v) පුංචි බණ්ඩා සිල්ලර වෙළෙඳසැලක හිමිකරුවෙකි. දිගුකලක සිට ඔහු මෙම ව්‍යාපාරයේ යෙදී සිටිය ද කිසි දිනෙක බැංකුවක ජංගම ගිණුමක් පවත්වාගෙන ගොස් නැත. එබැවින් බැංකු ගනුදෙනු පිළිබඳව ඔහුට කිසිදු අත්දැකීමක් හෝ දැනුමක් නොමැත. ඔහු ව්‍යවහාර මුදල් ළඟ තබා ගැනීමටත් සැමවිටම මුදලින් ගනුදෙනු කිරීමටත් ප්‍රිය කරයි. වාණිජ බැංකුවක ජංගම ගිණුමක් මගින් ගනුදෙනු කිරීමෙන් ලැබිය හැකි ප්‍රතිලාභ පිළිබඳව පුංචි බණ්ඩාට ඔබ පැහැදිලි කරන්නේ කෙසේ ද? (ලකුණු 04)

**6.**

(i) ව්‍යාපාරයක සාර්ථක හෝ අසාර්ථක බවට එහි අභ්‍යන්තර හා බාහිර පරිසරයන් බලපානු ලැබේ.

(අ) ව්‍යාපාරයකට බලපාන අභ්‍යන්තර පරිසර සාධක දෙකක් නම් කර ඒවා ව්‍යාපාරයේ සාර්ථකත්වය කෙරෙහි බලපාන ආකාරය පැහැදිලි කරන්න.

(ආ) ව්‍යාපාරයකට බලපාන සාර්ව පරිසර සාධක දෙකක් නම් කර ඒවා ව්‍යාපාරයේ අසාර්ථකත්වය කෙරෙහි බලපාන ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 04)

(ii) (අ) වර්තමාන වෙළෙඳපොළ තුළ සුපිරි වෙළෙඳසැල් ක්‍රමය වැඩි ව්‍යාප්තියක් දක්නට ලැබුණ ද නාගරික හා ග්‍රාමීය ප්‍රදේශවල පවත්නා සති පොළ අඛණ්ඩව ක්‍රියාත්මක වේ. සතිපොළ තුළින් පාරිභෝගිකයා ලබන වාසිදායක තත්ත්වයන් කවරේ ද? (ලකුණු 02)

(ආ) සුපිරි වෙළෙඳසැල් සහ ආංශික වෙළෙඳසැල් අතර පවත්නා අසමානකම් **දෙකක්** ලියන්න. (ලකුණු 02)

(iii) (අ) ස්වයං සේවා වෙළෙඳාම තුළින් පාරිභෝගිකයන්ට සහ ව්‍යාපාරිකයන්ට අත්වන වාසි **දෙක** බැගින් ලියන්න. (ලකුණු 02)

(ආ) වර්තමානයේ සිල්ලර වෙළෙඳසැල්වලට පරිභෝගිකයන් අද්දවා ගැනීම සඳහා ව්‍යාපාරිකයන් අනුගමනය කරන ක්‍රියාමාර්ග කවරේ ද? (ලකුණු 02)

(iv) (අ) තොග වෙළෙඳාම සහ සිල්ලර වෙළෙඳාම පැහැදිලි කරන්න. (ලකුණු 02)

(ආ) තොග වෙළෙන්දාගේ කාර්යයන් **දෙකක්** ලියන්න. (ලකුණු 02)

(v) (අ) වර්තමානයේ වෙළෙඳුන් තම ගනුදෙනුකරුවන්ට වෙළෙඳ වට්ටම් දීමට වඩා මුදල් වට්ටම් දීමට වැඩි කැමැත්තක් දක්වයි. එසේ වීමට හේතු පැහැදිලි කරන්න. (ලකුණු 02)

(ආ) කුළිපිට ගැනුම් ක්‍රමයෙන් ගැනුම්කරුවන්ට අත්වන වාසි **දෙකක්** ලියන්න. (ලකුණු 02)

(i) (අ) වර්තමාන ගතික පරිසරය තුළ ව්‍යාපාර සංවිධානවල කළමනාකරණයේ අවශ්‍යතාවය වඩාත් වැදගත් වීමට බලපාන හේතු දක්වන්න. (ලකුණු 02)

(ආ) කාර්යක්ෂමතාවය ***(Efficiency)*** සහ සඵලදායිතාවය ***(Effectiveness)*** යන පද දෙක පැහැදිලි කරන්න. (ලකුණු 02)

(ii) කළමනාකරණ ක්‍රියාවලියට අදාළ මූලික කාර්යයන් වෙන වෙනම හඳුන්වා ඒවා අතර ඇති අන්තර් සම්බන්ධතාවය පෙන්වා දෙන්න. (ලකුණු 04)

(iii) කළමනාකරුවන් සතු අධිකාරිය, විශේෂඥතාවය හා කටයුතුවල ස්වභාවය පදනම් කරගෙන කළමනාකරුවන් වර්ග කර දක්වන්න. (ලකුණු 04)

(iv) (අ) සාර්ථක කළමනාකරුවකු වීම සඳහා තිබිය යුතු මූලික ගුණාංග කවරේද? (ලකුණු 02)

(ආ) කළමනාකරුවන් තුළ තිබිය යුතු සාමාන්‍ය කුසලතා වර්ග තුනකි. එම කුසලතා කවරේද? (ලකුණු 02)

(v) (අ) හෙන්රි මින්ස්බර්ග් ***(Henry Mintzberg)*** දක්වා ඇති කළමනාකරුවකුගේ භූමිකා වර්ග **තුන** ලියන්න. (ලකුණු 02)

(ආ) කාර්යක්ෂමතාවය සහ ඵලදායිතාවය අතර පවත්නා සම්බන්ධතාවය පැහැදිලි කරන්න. (ලකුණු 02)

(i) (අ) පාසැලක සාර්ථක කළමනාකාරිත්වයක් පවත්වාගෙන යාමට වඩා වැදගත් වන්නේ " ප්‍රජාතන්ත්‍රවාදී නායකත්ව ශෛලිය ද? නො එසේනම් ඒකාධිපති නායකත්ව ශෛලිය ද?" ඔබේ පිළිතුර හේතු සහිතව පැහැදිලි කරන්න. (ලකුණු 02)

(ආ) "සැලසුම්කරණය ඉදිරිය බැලීමක් වන අතර පාලනය යනු ආපසු බැලීමකි." මෙම ප්‍රකාශය සම්බන්ධයෙන් ඔබ එකඟවේ ද? හේතු පැහැදිලි කරන්න. (ලකුණු 02)

(ii) (අ) පාලන අවකාශය ***(Span of Control)*** යනු කුමක්ද? පටු පාලන අවකාශය සහ පුළුල් පාලන අවකාශයේ අති වාසි **දෙක** බැගින් ලියන්න. (ලකුණු 02)

(ආ) කළමනාකරණයේදී බලතල බෙදීම ***(Delegation of Authority)*** යනුවෙන් අදහස් කරන්නේ කුමක්ද? (ලකුණු 02)

(iii) (අ) සැලැස්ම ***(Plan)*** යන්න නිර්වචනය කොට එය සැලසුම්කරණයෙන් ***(Planning)*** වෙනස්වන ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 02)

Learning Resource Center
R
De Mazenod College
Kandana

(ආ) සංවිධාන සටහනක් ***(Organization Chart)*** යනුවෙන් අදහස් කරන්නේ කුමක්ද? එමගින් හෙළිවන තොරතුරු දෙකක් සඳහන් කරන්න. (ලකුණු 02)

(iv) සැලසුම් විවිධ ආකාරයෙන් වර්ග කර දැක්විය හැක. එම සැලසුම් පුළුල් බව අනුව, කාල රාමුව අනුව, භාවිත පරාසය අනුව, නිශ්චිතතාවය අනුව, වර්ග කරන්න. (ලකුණු 04)

(v) පහත සඳහන් සංකල්ප පැහැදිලි කරන්න.

- බලය සහ අධිකාරිය
- වගකීම සහ වගවීම
- මධ්‍යගතකරණය සහ විමධ්‍යගතකරණය
- විධිමත් සන්නිවේදනය සහ අවිධිමත් සන්නිවේදනය (ලකුණු 04)

❋❋❋❋❋

Learning Resource Center
R
De Mazenod College
Kandana